# රූපවාහිනී ප්‍රවෘත්ති සන්නිවේදනයේ දී රක්ෂණය විය යුතු මාධ්‍යවිද්‍යානුකූල ආචාරධර්මීය ප්‍රතිපදාව

**(සත්‍ය පුවත් සම්පාදනයෙහි ලා කෙරෙන සුවිශේෂ අවධාරණයකි)**

**ආචාර්ය සේන නානායක්කාර**

නූතන සමාජ ක්‍රියාවලිය තුළ රූපවාහිනිය යනු, වඩාත් සුවිශේෂ සංස්කෘතික මෙවලම කි. පවත්නා සමාජ ක්‍රියාකාරිත්වයෙහි ලා එයින් සිදුකළ හැකි බලපෑම අතිවිශාල බැව් විවිධ පර්යේෂකයෝ අවධාරණය කරති. දෘෂ්ටිය හා ශ්‍රවණය එක්ව කේන්ද්‍ර කොටගත් මාධ්‍ය ක්‍රියාවලියක චෛතසික බලපෑම අද්විතීය වීම (Levin 2010:49) ඊට පිටුදුන් විද්‍යාත්මක පදනම විය හැකි ය යන්න අතිශයෝක්තියක් නො වේ.

ආලෝක තරංග ඇසුරු කොටගෙන රූපය සිය ඇසට ගොදුරු කරගන්නා මිනිසා, එයින් ම ස්වකීය මනස තුළ පරිකල්පන උත්පාදනයෙහි ලා අත්‍යවශ්‍ය මූලික ශක්‍යතා සපුරා ගනියි. එනම්, සරල සන්නිවේදන ක්‍රියාවලියක චක්‍රීයමය ව්‍යූහය පිළිබඳ සලකා බලද්දි 'හඬ' ද්විතීය වන අතර, රූපය අද්විතීය වන බැවිනි. ක්ෂණිකත්වය (Immidiecy) තුළින් වහා දැනවෙන සංවේදනය මෙහි දී ප්‍රමුඛ වෙයි. එහි දී හඬ (Sound) ක්‍රියාකරනුයේ ද්විතීය සුවිශේෂතාවක් (Followed distinguished) ලෙස ය. කෙසේ වුව ද, විද්‍යුත් මාධ්‍යවිද්‍යානුකූල සත්තාවක් ලෙස මෙයින් තහවුරු කෙරෙනුයේ රූපය හා හඬ එක්වූ කල නිර්මාණය කෙරෙන ප්‍රබල මානව සන්නිවේදන ක්‍රියාවලිය කි.

එබඳු බලපෑම්සහගත සන්නිවේදනයක් මානව සමාජ ක්‍රියාකාරිත්වයෙහි ලා දක්වන පිටුබලය තක්සේරු කිරීම දුෂ්කර ය. එය සමාජ ප්‍රගමනයක් හෝ අවගමනයක් ද

විය හැකි ව ඇත. මන්ද යත්, රූපවාහිනිය බඳු ප්‍රබල ජනමාධ්‍යයක් තුළින් සමාජය වෙත සම්ප්‍රේෂණය කෙරෙන සමහරක් දේ නිත්‍ය වශයෙන් ම ඉෂ්ට ඵල ලබා නොදෙන බැවිනි. මෙය වඩාත් ගවේශනශීලීවත්, සංවිභාගශීලීවත් අධ්‍යයනය කළ යුතු කාරණය කි. එමෙන් ම, හැකිතාක් අපක්ෂපාතීවත්, මධ්‍යස්ථවත් තක්සේරු කළ යුත්ත කි.

සපුරා දොස් දැකීම හෝ සුදු හුනු තවරා, ප්‍රශස්තියෙන් හා සාටෝපසහගත වර්ණනාවෙන් ම එය නිදොස් කිරීම ද සමාජද්‍රෝහී ක්‍රියාවකැ යි යන්න අපගේ ඇඩි විශ්වාසය යි. යහපත, අයහපත ලෙස දැකීමත්, අයහපත, යහපත ලෙස දැකීමත්, නූතන සමාජ විග්‍රහයෙහි ලා වන කූප්‍රකට න්‍යායයක් වන බැවිනි. ඒ අනුව, පැසසිය යුත්ත පසසන්නටත්, වැනසිය යුත්ත වනසන්නටත් පසුබට නොවීම සාධාරණ සමාජයක් අනුදැන පිළිපැදිය යුතු ප්‍රගතිගාමී මානුෂික ප්‍රතිපදාවක් බව අවධාරණය කරනු කැමැත්තෙමි.

එබඳු යහපත් සමාජයක් ගොඩනැඟීමෙහි ලා අදාළ පසුබිම සකසන්නට රූපවාහිනිය තරම් ශක්‍යතා පූර්ණ වෙනත් මාධ්‍යයක් නැතැයි කීම අතිශයෝක්තියක් නො වේ. මූලික වශයෙන් තොරතුරුවලින් හා අධ්‍යාපනයෙන් සමාජය දැනුම්වත් කෙරෙන අතර, එය වඩාත් ප්‍රබල, පුවත් සම්පාදකයෙකු, ගුරුවරයෙකු මෙන් ම සමාජ හිතකාමී මාර්ගෝපදේශකයකු ලෙස කටයුතු කරයි. විනෝදාස්වාද සම්පාදනය හා විවිධ කාර්යයන් සඳහා සාමාජිකයා පෙලඹවීම ද ඒ අතර ප්‍රමුඛ ය. ඒ අනුව රූපවාහිනිය වූ කලි නූතන සමාජය තුළ වන ප්‍රබල ම සමාජ සංවිධායකයා ලෙසත්, ශක්‍යතාපූර්ණ ආරක්ෂකයා ලෙසත්, හඳුන්වන්නට සමහර මාධ්‍ය විශාරදයෝ පෙලඹෙති. (Levin 2010:14-15) එපමණක් නො වේ. මේ වන විට නූතන සමාජය තුළ වඩාත් ජනප්‍රියතම විවෘත සංවාද මණ්ඩපය රූපවාහිනිය යැයි කීම අතිශයෝක්තියක් නො වේ.

මෙකී සකලවිධ පරමාර්ථ සාධනීය ලෙස ජයගත හැක්කේ, ඊට අදාළ ව අනුදැන ක්‍රියාකිරීමෙන් පමණක් බව අවධාරණය කළ යුත්ත කි. මන්දයත්, එකී මාධ්‍යය විෂයයෙහි ලා අනන්‍ය සාධාරණ ප්‍රබලතා, දුබලතා හා සීමාවන් (Potentials, Weeknesses and Limitations) අවභාවිතයෙන් මෙන් ම, සමාජය පිළිබඳ විද්‍යාත්මක ධර්මතා නොසලකා හැරීමෙන් සිදුවනුයේ පරිහානිය කෙරෙහි සමීපවීම පමණි. එසේ නම් කළ යුත්තේ කුමක් ද? මාධ්‍යවිද්‍යානුකූල ආචාරධර්මීය පදනම අර්ථ සම්පන්න ව භාවිත කිරීම යි. එනම්, එකී මාධ්‍යයෙහි ලා අනන්‍ය යහපත් අරමුණු, ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග ප්‍රබල ලෙස ප්‍රායෝගික කරවීම යි.

මෙම සංක්ෂිප්ත නිබන්ධය උදෙසා ප්‍රස්තුත වන්නේ ප්‍රවෘත්ති සන්නිවේදනයෙහි ලා රක්ෂණය විය යුතු මාධ්‍යවිද්‍යානුකූල ආචාරධර්මීය පදනම යි. 'මාධ්‍යවිද්‍යානුකූල' යන්න මෙහි කුළුගැන්වෙනු පෙනේ. එය එසේ වනුයේ, සියලු මාධ්‍යයන් උදෙසා ආචාරධර්ම පොදු වුවත්, රූපවාහිනී මාධ්‍ය උදෙසා ම අනන්‍ය වූ ආචාරධර්මීය තත්ත්වයක් ඇති බව හෙළිදරව් කිරීමට යි. රූපවාහිනිය එතරම් ම සුවිශේෂ ය.

ඒ සඳහා විද්‍යානුකූල සාක්ෂි සැපයෙන්නේ කෙසේ ද? රූපය දෘෂ්ටිගෝචර ය. ඇස්, කන්, නාසා, දිව හා සම් ආදී වූ පංචේන්ද්‍රියයන්ගෙන් වඩාත් වැදගත් වූ දෘෂ්ටීන්ද්‍රිය අධ්‍යාත්මය කෙරෙහි බලපෑම් කරන්නා වූ ආකාරය අතිශය වැදගත් ය. ඉලෙක්ට්‍රෝන රූප රාශියකින් හා ශබ්ද මාලාවකින් කෙරෙන ක්‍රියාවලිය රූපවාහිනිය මඟින් සිදුකෙරේ.

(Eastman, Heard and Klein 1981:121) එය රූපමය හා ශබ්දමය සංඥා හා සංකේතාවලියක් (Audio Visual Signals and Symbols) ලෙස මිනිස් මනස හා සම්බන්ධතා ඇතිකර ගනියි.

මෙකී රූප හා ශබ්ද කිසියම් හැඟීම් මාත්‍රයක් නියෝජනය කරයි. ඒවා අඩු වැඩි වශයෙන් ප්‍රබල හෝ දුබල හෝ විය හැකි යි. බලපෑම්කාරයකයක් ලෙස විචල්‍ය බවක් පෙන්නුම් කරයි. එහෙත්, කිසියම් ගැඹුරු ප්‍රතිරූපයක නිෂ්පත්තියක් එමගින් හෙළිදරව් කෙරේ. (Eastman, Heard and Klein 1981:121) එනම්, මිනිසුන් හා ගැහැනුන් කතාකරන, අඳින පලඳින, යන එන හා හැසිරෙන කුදුමහත් සකලවිධ ක්‍රියාකාරකම් පද්ධතියක පිළිබිඹුවක් මිනිස් මනසට ප්‍රදානය කරයි. ප්‍රේක්ෂකයෝ, රසිකයෝ හෝ පොදුවේ ගත් කල ග්‍රාහකයෝ හෝ එය නරඹති. ස්වකීය සිත හා කිසියම් කාල්පනික ගනුදෙනුවක යෙදෙති. එමගින් විද්‍යුත් රසායනික ආවේගයන් (Electro Chemical Impulses) ස්නායු පද්ධතිය ඔස්සේ ගමන් කරවනු ලබයි. එය ප්‍රතිචාරාත්මක ය. සැබැවින් ම, එය එක්තරා පෙළ කියවීම කි. (Text Reading) (Slant 1986:21) විටෙක අපි එය පිළිගනිමු. තවත් විටෙක පිළිකෙව් කරමු. නැවත අපි එය අනුගමනය කරමු. දෘශ්‍යමය හා ශ්‍රව්‍යමය සංඥා හා සංකේත මගින් කිසියම් වෙනස් අරමුණක්, පරමාර්ථයක්, විශ්වාසයක් හෝ ක්‍රියාකාරකමක් හෝ දක්වා මිනිස් සිත ගමන් කරවනු ලබන්නේ එලෙසිනි.

එය එතෙකින් නොනවතියි. දිගින්දිගට ම සිදුවෙයි. අඛණ්ඩ ව සිදුවෙයි. උච්චාවචනයන්ට ලක්වෙයි. වර්ධනය වෙයි. තවදුරටත් ක්‍රියාත්මක වෙයි. එහි අවසන් ප්‍රතිඵලය ඉෂ්ට හෝ අනිෂ්ට හෝ විය හැකි ය. ප්‍රවෘත්ති සම්බන්ධයෙන් සලකා බලන විට වුව එය සපුරා සත්‍ය බව පෙන්නුම් කරන ධර්මතාවකි. එබැවින්, රූපවාහිනිය සඳහා ආචාරධර්ම පද්ධතියක් අත්‍යන්තයෙන් ම අවශ්‍ය බව පැවසීම යුක්තියුක්ත ය.

ආචාරධර්ම යනු (Ethics) කවරේදැ යි මෙහි දී ගවේෂණාත්මක කරුණු ඉදිරිපත් කළ යුතු නො වේ. සංස්කෘතික සත්ත්වයකු ලෙස ජීවත් වන මිනිසා තුළ සහජයෙන් ගොඩනැගෙන මානව සංලක්ෂණයක් (Human distinguished) ලෙස මෙය හඳුන්වා දිය හැකි යි. යහපත් අයහපත් දේ හෝ හොඳ නරක දේ හෝ වෙන්කර පෙන්වන්නකි. එය සමාජ පදනමකින් යුක්ත බවත්, හුදු සංකල්ප විග්‍රහයට ඔබ්බෙන් වූ සමාජ භාවිතය සමඟ ඒකාබද්ධ වන්නක් බවත් අවධාරණය වෙයි. මේ පිළිබඳ ගවේෂණාත්මක කරුණු හෙළිදරව් කළ ප්‍රාමාණිකයකු වූ හර්බට් ස්පෙන්සර් ප්‍රකාශ කරනුයේ, එය හුදෙක් මානවයා සම්බන්ධයෙන් පමණක් නො ව, අනෙක් සත්ත්වයින්ටත් පොදු වූවක් බවයි (Spencer 1930:132).

යුතුකම්, වගකීම් හා අයිතිවාසිකම් එහි ප්‍රමුඛ ය. සිදුවිය යුතු හෝ පැවැතිය යුතු හෝ සමාජ ගති ලක්ෂණ (Due social events) ලෙස ඒවා හැඳින්වෙයි. මේ හා සම්බන්ධ සමාජ ස්වරූපයන් නම් කෙරෙනුයේ ඇගයුම්ශීලී කටයුතු (Evaluation Activities) ගනයට යි. සෙසු සියලු සමාජ ස්වරූපයන් හා බැඳී පවතින්නා වූ ආචාරධර්ම තවත් විටෙක ප්‍රගතිකාරක අවශ්‍යතාවක් ලෙස ද (Progressive Need) හෙළිදරව් කෙරෙනුයේ, එමගින් සමාජ ප්‍රගමනය උදෙසා සිදුකෙරෙන බලපෑම අතිශය සාධනීය වන බැවිනි.

ඒ අනුව ඒ සඳහා පාදක කොට ගැනෙනුයේ මානව ජීවිතයේ පැවැත්ම යි. ඊට අදාළ චර්යාව යි. (Behaviour) යහපත් චර්යාව හෝ අයහපත් චර්යාව යනු ආධ්‍යාත්මික සංකලක්ෂණ සහිත පැවැත්ම කි. එමගින් මැඩලිය හැකි, වළකාලිය හැකි හෝ අවම කරගත හැකි හෝ

සමාජ උවදුරු පිළිබඳ ව ද ඉතිහාසය දෙස් දෙයි. මන්දයත්, එය ආධ්‍යාත්මික ප්‍රගමනයේ (In Spiritual Progress) මහරු ඵලයක් වන බැවිනි.

මේ, ඒ සඳහා යෝග්‍ය සාක්ෂි ප්‍රකාශය කි. 'ඉන්දියානු දර්ශනය අවශ්‍යයෙන් ම ආධ්‍යාත්මික ය. කාලයෙන් ඇතිවූ විනාශයත්, ඉතිහාසයේ හදිසි ආපදාවනුත් මැඩපවත්වාලීමට ඉන්දියාවට හැකි වූයේ එහි ඇති, දැඩි ආධ්‍යාත්මිකත්වය නිසා මිස, දියුණු කරගත් මහඟු දේශපාලන සංස්ථාවක් නිසා හෝ සමාජ සංවිධානයක් නිසා හෝ නො වේ (Radhacrishnan 1925:3-4). සකලවිධ අපල උපද්‍රව කරණකොටගෙන දුකට පත්වෙන මානව ජීවිත, එයින් මුදා ගැනීමෙහි ලා උත්තුංග ආධ්‍යාත්මිකත්වයට ඇති ශක්‍යතාව එහි විස්තර වනු පෙනේ. ඒ, ආචාරධර්මීය හැසිරීම් පද්ධතියක් (Ethical Behavioural System) ඇසුරිනි.

මෙය වඩාත් ගැඹුරින් සලකා බලන කල උත්තරීතර බෞද්ධ ප්‍රතිපදාව පිළිබඳ ව අවධාරණය කළ යුතු ව ඇත. පෙරඅපර දෙදිග හෝ වෙනයම් දාර්ශනික පදනමකට අනුව හෝ මෙම කාරණය ගැඹුරින් විග්‍රහ කිරීමේ දී වඩාත් කුළුගැන්වෙනුයේ බෞද්ධ ආචාරධර්ම වන බැවිනි.

මෙම නිබන්ධයට කේන්ද්‍රීය ව ප්‍රස්තුත කරගන්නා රූපවාහිනී ප්‍රවෘත්ති සන්නිවේදනය හා ආචාරධර්ම පිළිබඳ අපගේ අවධානය යොමුකළ යුත්තේ දැන් ය. පූර්වෝක්ත ආචාරධර්ම විග්‍රහයට අනුව, යම් කිසි පුද්ගලයෙක්, සංවිධානයක් හෝ ආයතනයක් හෝ සමාජය දැනුම්වත් කරන්නේ නම් එය සමාජ ප්‍රගතිකාරක ක්‍රියාවලියකි (Social Progressive Act.). එය යහපත් සමාජ හිතකාමී හා වගකීම් සහිත පූර්ව කොන්දේසි සපුරා අනුදැන සිදුකළ යුත්තක් බව අමතක නොකළ යුතු ය. මන්දයත්, සමාජය ප්‍රගමනය කරා යොමු කරවීමේ දී, සමකාලීන සමාජය පිළිබඳ යථාවබෝධය පිරිසිඳ පසක් කළ යුතු බැවිනි. එසේ නම්, ඒ හා සම්බන්ධ ප්‍රමුඛ ආචාරධර්මය හෝ මුල්ම සිල්පදය කුමක් ද? සත්‍යය පැවසීම ය. යථාර්ථය නිසි ලෙස හෙළිදරව් කිරීම ය. මිථ්‍යාව දුරලන සමාජ පැවැත්මට පිටුබල සැපයීම ය. ප්‍රජාතන්ත්‍රවාදය සපිරි යහපාලනය ශක්තිමත් කරවීම ය. යහපත් ජනමාධ්‍යයක ප්‍රවෘත්ති සම්බන්ධ ආචාරධර්මීය ප්‍රතිපදාව එය විය යුතු ය. එය යුක්තිගරුක ය. සමාජ සාධාරණය කුළුගැන්වීම ය.

යුක්තිය හා සාධාරණය ද පෙර කී සමාජ යහපැවැත්මෙහි වන ආනුෂංගික සමාජ ස්වරූපයන් ලෙස ගැනේ. ඒ අනුව එය සත්‍යය හා අත්‍යන්තයෙන් බැඳී පවතින්නකි. මන්දයත්, යුක්තිය හා සාධාරණ, උදෙසා මූලපදනම ගොඩනැගෙනුයේ සත්‍යය පසුබිම් කොටගෙන බැවිනි. ඒ අනුව සත්‍යයෙන් තොර යුක්තිගරුකභාවයක් හෝ සමාජ සාධාරණයක් හෝ අපේක්ෂා කිරීම නිෂ්ඵල වෑයමක් බවට කෙරෙන ප්‍රකාශය නිරවද්‍ය ය.

අමෙරිකානු පුවත්පත් පිළිබඳ ඔම්බුඩ්ස්මන්වරයකු ලෙස කටයුතු කළ ප්‍රවීණ මාධ්‍ය විශාරදවරයකු වූ ඩොනල්ඩ් ඩී. ජෝන්ස් විසින් සපයන ලද පූර්විකාවක් මෙහි ලා ඇතුළත් කිරීම වඩාත් අවස්ථාවෝචිත වෙයි. කවර මාධ්‍යයක වුව ආචාර ධර්ම පිරිහීම ආරම්භ කෙරෙනුයේ අසත්‍ය ප්‍රචාරය කිරීමේ පටන් බව ජෝන්ස්ගේ අදහස යි. 60 දශකය පදනම් කොටගත් ජනමාධ්‍ය ප්‍රවෘත්ති පිළිබඳ විවරණයක් සපයන ඔහු, සරල ව ගත් කල ප්‍රවෘත්ති සම්බන්ධ ව එල්ල කෙරෙන පොදු පැමිණිලි අටක් ගැන වැදගත් හෙළිදරව්වක් කරයි. කරුණු වශයෙන් සලකා බලන කල ඒවා පහත දැක්වෙන පරිද්දෙනි.

1. අසත්‍යය/වැරැදිසහගත බව (Inaccuracy)
2. පුහු අහංකාරසහගත බව (Arrogance)

3. රහස්‍යභාවයට නිගරු කිරීම (Disregard of Privacy)
4. අසංවේදීභාවය (Insensitivity)
5. ප්‍රජාව නොසලකා හැරීම (Ignorance on the Community)
6. නොවැදගත් දේ උත්කර්ෂයට නැංවීම (Glorification of the Unusual)
7. නරක ලෙස ලිවීම (Bad Writing)
8. නරක ලෙස සංස්කරණය (Bad Editing)

මේවා හැටේ දශකයටත්, පුවත්පතටත් පමණක් වලංගු නොවූ, කාලත්‍රයට ම ගැළපෙන, සියලු මාධ්‍යයන් කෙරෙහි අදාළ වන විෂයමූලික විග්‍රහයන් ලෙස අවධාරණය වෙයි. මෙහි අන්තර්ගත සියලු තත්ත්වයන් ආචාරධර්ම උල්ලංඝනයන් බව ජෝන්ස්ගේ අදහස යි. එනම්, යහපත් ප්‍රවෘත්තියක් නිර්මාණය කිරීමෙහි දී අත්‍යවශ්‍යයෙන් ම බැහැර කළ යුතු ආස්ථානයන් ය.

1948 දෙසැම්බර් මස 10 වන දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කරන ලද, එහි පළමු ව්‍යවස්ථාව විසින් පිළිගන්නා ලද මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 19 වන වගන්තිය ප්‍රකාර ව, සත්‍ය ප්‍රකාශ කිරීමේ හා දැන ගැනීමේ අයිතිය සියලු දෙනා සතු ව පවතී යි.

විශ්වීය ගුණයකින් යුක්ත පරම මානුෂීය අයිතියක් ලෙස එහි අවධාරණය කෙරෙන, සත්‍ය ප්‍රකාශ කිරීමේ හා දැනගැනීමේ 'නිදහස' වූ කලී, සමස්ත මානව වර්ගයට එක ම ඥාතිත්වයකින් හා සහෝදරත්වයකින් බැඳ තබන්නක් බව පෙනේ. නමුත්, විවිධ රටවල පවත්නා සමාජ, සංස්කෘතික හා දේශපාලනික රටාවන්ට අනුකූල ව සැකසුණු නීති අණපනත් මඟින් එකී පරම අයිතිය හෝ නිදහස හෝ එක්තරා ව්‍යාජයක් හෝ නිෂ්ඵල ප්‍රලාපයක් බවට හෝ පත් කෙරෙන බැව් පැහැදිලි ය.

1832 ප්‍රංශයේ පැරිස් නුවර දී ලෝකයේ ප්‍රථම ප්‍රවෘත්ති සේවාව බිහිවූයේ ද පොදුජනයා වෙත සත්‍ය තොරතුරු දැනගැනීමට සැලැස්වීමේ අරමුණු පෙරදැරි කොටගෙන බව (Maray 2010:113) ඉතිහාසය සාක්ෂි දරයි. චාල්ස් ලුවී හවාස් (Charles Levis Havas) නම් වූ හංගේරියානු පවුලකින් පැවත ආ භාෂා පරිවර්තකයා එහි පුරෝගාමියා විය. 1832 දී ඔහු 'Havas Buero' හෙවත් 'Agency Havas' ආරම්භ කළේ 'සත්‍යය පතුරුවමු - සමාජය සුරකිමු' යන තේමාව මුල් කොටගෙනය (Maray 2010:113).

ප්‍රවෘත්තියක් යනු කුමක්දැ යි සරල ව සාකච්ඡා කිරීමේ දී අදහස් කෙරෙන්නේ සිදු වූ යමක් පිළිබඳ තොරතුරු සැපයීම කි. කවුද? කුමක් ද? කෙසේ ද? කවදා ද? කොහේද? ආදී තොරතුරු සහිත විස්තරාත්මක ප්‍රකාශනයක් එහි අන්තර්ගත විය. එය එසේ වුව ද, දියුණු විද්‍යාව හා තාක්ෂණය සමඟ බැඳුණු නූතනය, ඒ සඳහා නව අර්ථකථනයක් සම්පාදනය කරයි. එනම්, ප්‍රවෘත්තියක් යනු, දැන් සිදුවෙමින් පවත්නා දෙයක් බවට පත්වී ඇත. ඒ අනුව, තොරතුරු තාක්ෂණයේ දියුණුව පදනම් කොටගත් නව ප්‍රවණතාව යි. ජාතික මට්ටමෙන් පමණක් නො ව, මෙය ජාත්‍යන්තර තත්ත්වයෙන් ද සිදු කෙරෙන්නකි.

සත්‍ය සැඟවීම, අසත්‍ය, සත්‍ය ලෙස ප්‍රකාශයට පත්කිරීම හා විවිධ ප්‍රයෝගයන් කරණකොටගෙන ප්‍රවෘත්ති විකෘති කිරීම ආදී, ආචාරධර්මයන්ට පටහැනි ක්‍රියාවලීන් ද එකී තාක්ෂණ වෘද්ධියත් සමඟ ම කැපී පෙනෙන සුවිශේෂතාව කි. බටහිර රටවල වෙළෙඳ ඒකාධිකාරය පවත්වාගැනීම අරමුණු කොටගෙන, දියුණුවෙමින් පවත්නා රටවල සංවර්ධන පුවත් නොසලකා හැරීම බහුල ය. 'සංවර්ධන පුවත්' කියා දෙයක් නැති

බවත්, එබන්දක් ඇතත්, එහි ප්‍රවෘත්ති වටිනාකමක් නැති බවත් ඔවුන්ගේ අවධාරණය යි. එබැවින් ම, ඉන්දියාව පුරා ම වුව අති උත්කර්ෂයෙන් තිරිඟු වවා සාර්ථක වීම, බටහිරට වැදගත් පුවතක් නොවන බව අමෙරිකානුවෝ කියති.

සංවර්ධනය වෙමින් පවත්නා රටවල සංවර්ධන පුවත්වලට ද අත්වී ඇත්තේ එම බේදවාචකය ම ය. උත්තුංග අරමුණු සහිත ව ආරම්භ කෙරෙන ජනතාවාදී ව්‍යාපෘතීන්, පසු ව හුදු ප්‍රචාරක අරමුණු නිසා ඇඩි නොසලකා හැරීම්වලට භාජන වෙයි. ඒවා ජනතාව අරමුණු කොටගෙන, ඔවුන්ගේ සුභසාධනය ඉලක්ක කොටගෙන, පැහැදිලි ප්‍රතිපත්ති සහිත ව ක්‍රියාකාරි වනු දක්නට නො ලැබේ.

විදෙස් වාර්තාකරුවන්ගේ වැඩි අවධානය දිනාගත හැක්කේ හුදු ජාතිවාදී ආගම්වාදී කැරලි කෝලාහල හා ආකර්ෂණශීලී සමාජ ව්‍යසන හා විකෘතිකර සිදුවීම් ඇසුරෙන් පමණි. ඒ අනුව, අන්තර්ජාතික ව බෙදාහැරෙන ප්‍රවෘත්තිවල කිසිදු සමබරතාවක් නැති බව බටහිරට එල්ල වෙන චෝදනාව යි.

එබැවින්, 1976 ඉන්දියාවේ නවදිල්ලි නුවර පැවැත්වුණු නොබැඳි අමාත්‍යවරුන්ගේ සම්මේලනයේ දී ඉන්දීය අග්‍රාමාත්‍ය ශ්‍රීමතී ඉන්දිරා ගාන්ධි යෝජනා කළේ 'තම රටේ පුවත් තමන් ම වාර්තා කළ යුතු' බව යි. එසේ නො වන්නේ නම්, බටහිර මාධ්‍ය විසින් උත්කර්ෂයට නංවනු ලබන්නේ ඔවුන් වෙත ආදායම් ගලා එන, ඔවුන් සංතෘප්තියට පත්කරන ප්‍රවෘත්ති පමණි.

නයිජීරියානු විද්‍යුත් නාළිකා රසක ඉහළ තනතුරු හෙබවූ කීර්තිමත් ලේඛක චිනුවා අචිබේ ඒ සම්බන්ධයෙන් ප්‍රකාශ කළේ මෙබඳු අදහස කි.

"අපට ජාත්‍යන්තරය දෙස කට අයා බලා සිටිය නො හැකි ය. ජනමාධ්‍යවලින් ඉදිරිපත් කළ පමණින් හැම දෙයක් ම නො පිළිගෙන පෙරළා ප්‍රශ්න කිරීමට ජනතාව මෙහෙයවන සබුද්ධික සමාජයක් බිහිකිරීමට ජන විඥානය ගොඩනැඟීම මෙන් ම, නිරන්තර ව අවධියෙන් පසුවන සක්‍රීය ජනතාවක් බිහිකිරීම අපගේ අරමුණ විය යුතු ය."

ඒ ජාත්‍යන්තරයෙනි. අප රට තුළ වුව ද, මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවත්නා රූපවාහිනී නාළිකා ගණනින් පහළොවක් පමණ වෙයි. විවිධ නාළිකාවන් විවිධ අරමුණු, ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ගයන්හි සක්‍රිය වනු පෙනේ. රාජ්‍ය රූපවාහිනී නාළිකා ආණ්ඩුව හා ඔවුන්ගේ ක්‍රියාමාර්ගයන් අතිශයෝක්තියෙන් යුතු ව ඇඩි ලෙස උත්කර්ෂයට නංවන අතර, පෞද්ගලික රූපවාහිනී නාළිකා ඔවුනොවුන් තුළ පවත්නා පෞද්ගලික න්‍යාය පත්‍ර ඔස්සේ ක්‍රියාකරනු පෙනේ. මහජන සේවා සංකල්පය තුළ (In the Public Service Concept) අවංක ව ක්‍රියා කරන මාධ්‍යයක් පිළිබඳ සිතීම දුෂ්කර වුව ද, සමහර නාළිකාවක් දෙකක් හෝ ඉතා සුළුතරයක් විටින් විට අඩුවැඩි වශයෙන් ජනතාව වෙනුවෙන් පෙනී සිටියි. එද, ස්වකීය ලාභාපේක්ෂාවන් කෙරෙහි හානිකර නො වන අයුරින් බව පෙනේ. මන්දයත්, අපක්ෂපාතිත්වය, එකගත්වයෙන් තොර බව හෝ ආණ්ඩු විරෝධය වූ කලී ආදායම් හීන කරවීමෙහි ලා හේතුවන බැවිනි. සෙසු වැඩසටහන්වල අරමුණු, ආකෘතිය, ව්‍යුහය, අන්තර්ගතය හා ප්‍රචාරය කෙලෙසක වුව ද ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම්වලට අදාළ වැඩසටහන් මෙහි දී සුවිශේෂ අවධානයට ලක් කෙරේ.

1912 අංක 97 දරන ප්‍රසිද්ධ රැඟුම්පාලක නීති පද්ධතියේ සිට (Public Performance Ordinance) අද දක්වා අප රට තුළ ස්ථාපිත අණපනත් ඇතුළත් නීති ප්‍රඥප්ති රාශියකි. 1959 අසභ්‍ය ප්‍රකාශන ආඥාපනත, 1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත, 1981 එම පනත යටතේ වූ පුවත්පත්කලාවේදීන් සඳහා පැනවුණු ආචාරධර්ම පද්ධතිය, 1980 අංක 30 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය, 1988 අංක 48 දරන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා පනත ද ඒ අතර වෙයි. කේන්ද්‍රීය විෂය පිළිබඳ සාකච්ඡා කිරීමේ දී මෙයින් වඩාත් සැලකිල්ලට බඳුන්විය යුත්තේ 1982 අංක 6 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත යි.

'ශ්‍රී ලංකාවේ රූපවාහිනී ප්‍රචාරක සේවය පවත්වා ගෙන යාමේ කාර්යය සඳහා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව පිහිටුවීම සඳහා ද, ඒ සේවය සංවර්ධනය කිරීම, ව්‍යාප්ත කිරීම හා දියුණු කිරීම සඳහා ද, ඒ හා සම්බන්ධ ව හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලසීම පිණිස වූ පනතක් ලෙස' (ශ්‍රී ලංකා රූප. සං. ප. 1982) මෙය හඳුන්වා දී ඇත. එහි දෙවන කොටසේ 7.2 (ඇ) අනුවගන්තිය ප්‍රකාර මෙසේ සඳහන් වෙයි. 'වැඩසටහන්වල ඇතුළත් කරනු ලබන (කවර හෝ ආකාරයේ යම් ප්‍රවෘත්ති නිසි පරිදි නිවැරැදි ව හා අපක්ෂපාතී ව හා මහජන යහපත පිළිබඳ නිසි සැලකිල්ලෙන් යුතු ව ඉදිරිපත් කරනු ලබන බව' (ශ්‍රී ලංකා රූප. සං. ප. 198:5)

එයින් අවධාරණය කෙරෙනුයේ ප්‍රවෘත්ති සම්බන්ධයෙන් වූ සංස්ථාවේ ප්‍රතිපත්තිය හා කාර්යභාරය යි. එහෙත්, රාජ්‍ය රූපවාහිනී නාළිකා සැලකිල්ලට බඳුන්කොට, පූර්වෝක්ත වගකීම හරිහැටි ඉෂ්ටවේ ද යන්න පිළිබඳ ගැඹුරින් අධ්‍යයනය කළ යුත්තක් නො වේ. එය එපමණට ම පැහැදිලි ය. ආණ්ඩුවේ නාළිකා ගෙඩියපිටින් ම ආණ්ඩුවේ භුක්තියට සින්න වී තිබෙන අයුරු අපූරු ය. තට්ටුමාරු ක්‍රමයට ආණ්ඩු මාරු වෙද්දී ඒ ඒ ආණ්ඩු පක්ෂයට අදාළ වන පරිද්දෙන් අපේ ප්‍රවෘත්තිවල මුහුණුවර ද මාරුවනු දැකිය හැකිවීම විශේෂත්වය කි. පාලක පක්ෂයේ බලවතුන් ව සිටිය දී නො පෙනුණු පරම සත්‍ය, වඩාත් පැහැදිලි ව පෙනෙනුයේ ඔවුන් විපක්ෂයට තල්ලු වූ විට ය. එවිට ඔවුහු යුක්තිය, සාධාරණය හා සත්‍යය වෙනුවෙන් පණ පුදන්නට වුව පෙරට එන දේශප්‍රේමියෝ බවට පත්වෙති.

2007 පෙබරවාරි 27 වෙනිදා 'දිවයින' ඉරිදා සංග්‍රහයට ලිපියක් සපයමින් මහාචාර්ය නන්දසේන රත්නපාලයන් විසින් අවධාරණය කරන ලද කාරණා කිහිපයක් මෙහි දී යළි එපරිද්දෙන් ම උපුටා දක්වනුයේ, එය එතරම් ම අප සාකච්ඡාව උදෙසා අදාළ වන බැවිනි. අපේ රටේ රූපවාහිනී නාළිකා තුළින් සැබෑ ජනතා මෙහෙවරක් ඉටු කෙරෙන බවට සතුටු වන්නට නම් ඒවා ආචාරධර්මානුකූල ව ක්‍රියා කළ යුතු බව ඉන් කියැවිණි. ඒ අතරිනුත් ප්‍රවෘත්ති හා කාලීන වැඩසටහන් සුවිශේෂ වනු පෙනේ. එහි දී ඔහු විසින් අවධාරණය කරනු ලබන සිව් වැදැරුම් කාරණා මෙසේ ය;

1. ඇත්ත කීම, කිසි විටෙක සත්‍ය යට නො කිරීම
2. පක්ෂග්‍රාහී නො වීම, රජයට හෝ අතකොළුවක් නො වීම
3. සමාජීය වගකීම හරියාකාර ව ඉටුකිරීම
4. ජනතාවට සිදුවන වැරැදි, දූෂණ, ගසාකෑම්, අසාධාරණයන් බියක් නැති ව

හෙළිදරව් කිරීම, සමාජය සෑම අතින් ම ප්‍රජාතන්ත්‍රවාදී ජීවිතයකට හුරුකරවීම, විළිබිය, මත ඉවසීම, සාකච්ඡාවෙන් හැම ගැටලුවක් ම විසඳා ගැනීමට පුරුදුවීම මෙහි ලා වැදගත් වන්නේ ය.' (රත්නපාල 2007:56-57)

උද්ධෘතය තුළ සටහන් ව ඇති කරුණු අතිශය වැදගත් ය. නමුත්, දේශපාලන බලය හොබවන්නෙකුට හෝ එකී රුස්වලල්ලෙන් බැබළෙන හුදු නිලධාරියෙකුට නම් එහි සත්‍යතාවක් නො පෙනෙන්නට පුළුවන. එහෙත්, එහි වගකීම්සහගතභාවය අතිශය ගැඹුරු බව පෙනේ. ප්‍රකට ජනමාධ්‍ය විශාරදවරයකු වූ මහාචාර්ය විල්බර් ශ්‍රාම් ජනමාධ්‍ය හා ජාතික සංවර්ධනය (Mass Communication and the National Development) නම් සිය කෘතියෙහි පෙන්වා දෙන පරිදි, 'සත්‍ය තොරතුරු හුවමාරුව හා ඒ කෙරෙහි වඩවඩාත් දැනුම්වත් වීම යනු ජාතික සංවර්ධනය සඳහා වන යෝග්‍ය වාතාවරණය සැකසීමක්' බව (දිසානායක 1974:22) සඳහන් කරයි.

සැබැවින් ම, ජාතික සංවර්ධනය සඳහා යෝග්‍ය වාතාවරණය සැකසීම යනු, රටක මහජන සුභසිද්ධිය සඳහා වන රාජ්‍යයක වගකීම යි. එය ආචාර ධර්මානුකූල ය. සදාචාර සම්පන්න ය. එනම්, ආචාරධර්මයෙහි නිසි ලෙස කටයුතු කිරීම කි. එසේ නො වේ නම්, දේශයේ නිදහස හෝ ජනතාවගේ විමුක්තිය හෝ මිථ්‍යාවක් වනු නිසැක ය. 'සත්‍ය තොරතුරු නො ලබන ජාතියක් කෙදිනක හෝ ඉක්මනින් ම අනුන්ගේ වහළුන් බවට පත්වන වග' හැරල්ඩ් ලැස්කි ප්‍රකාශ කළේ එබැවිනි. සත්‍ය තොරතුරු නො ලබන ජාතියකට කාලීන අවබෝධය හෝ යථාර්ථය පිළිබඳ දැනීමක් හෝ හැඟීමක් හෝ තිබිය නො හැකි ය. එබැවින්, ඔවුන් වහලුන් බවට පත්වීම ඉක්මනින් සිදුවිය හැකි ය යන්න අතිශයෝක්තියක් නො වේ. එය වළක්වාලීම වගකීම්සහගත මාධ්‍යයක් සතු සදාචාරය යි.

එබඳු ජනතාවකගේ මිනුමට හසුවන්නේ ඔවුනොවුන්, භුක්ති විඳින තාවකාලික සුඛවිහරණය පමණි. එය ස්ථාවර වූවක් නො ව, නිබඳ ඔවුන් ඇස ගැටෙන අතිසුඛෝපභෝගී යාන වාහන, ගොඩනැඟිලි, අධිවේගී මාර්ග හා විසිතුරු සැරසිල්ලෙන් යුතු බඩු භාණ්ඩයෙන් සපිරි සුපිරි වෙළෙඳසල් එහි නිර්ණායක බවට පත්වෙයි. ඊට යටින් ජනතාව පෙළන ඇත්ත ප්‍රශ්න හෙළිදරව් නො වේ. ඒවා සාකච්ඡාවට බඳුන් නො කෙරෙන වාතාවරණයක් තුළ ජනමාධ්‍යයෙන් අභිවාදනයට ලක් කෙරෙනුයේ ව්‍යාජ සංවර්ධනයක් පිළිබඳ ව ය. දිනෙන් දින ඉහළ නඟින ජාතික ණය කන්ද අනාගත ව්‍යසනයක පෙරනිමිත්තක් කොට සලකන්නට කිසිවෙකු ඉදිරිපත් නො වේ. එවැන්නෙක් වුව ද, ඔහු දේශද්‍රෝහියෙක්, ආණ්ඩු විරෝධියෙක් හෝ පොදුජන සතුරෙක් බවට හෝ පත් කිරීම නූතන ජනමාධ්‍ය සම්ප්‍රදාය බවට පත් ව ඇති බවක් පෙනේ.

ඒ අනුව පොදු ජනතාවට සැබෑ තොරතුරු සම්ප්‍රේෂණය වීම ප්‍රමාණවත් බවක් පෙන්නුම් නො කෙරේ. බලහත්කාරය හා අතිශයෝක්තිය විසින් සියල්ල සියුම් ලෙස ආවරණය කෙරෙමින් පවතී. ක්‍රියාත්මක කෙරෙමින් පවත්නා අත්‍යවශ්‍ය යහපත් කටයුතු කෙරෙහි වුව ජනතාව තුළ සාධනීය අවබෝධයක් ඇති කරවීම දුෂ්කර වන්නේ එබැවිනි. නිෂ්ඵල කටකතාවට හා ආණ්ඩු විරෝධී ව්‍යාජ දුෂ්ප්‍රචාරවලට ජනතාව ඉක්මනින් රැවටිය හැකි වන්නේ ද එබැවිනි. එය, යහපත් ලෙස කෙරෙන රාජ්‍ය කටයුතු කෙරෙහි වුව හානිකර ප්‍රතිඵල ගෙන දෙන්නකි. මෙය ගැඹුරින් අධ්‍යයනය කොට ප්‍රතිචාර දැක්විය

යුත්තකි. සියලු ව්‍යසන නිර්මාණය කෙරෙනුයේ ආචාරධර්මවලට පටහැනි, සදාචාර විරෝධී ක්‍රියාකලාපයන් හේතුකොටගෙන බව ඒ අනුව අවධාරණය කෙරේ.

ලාංකේය රූපවාහිනී ප්‍රවෘත්ති ප්‍රකාශයක මූලික පියවර පිළිබඳ අවධානය යොමු කිරීමේ දී මුල සිට අග දක්වා යථෝක්ත කරුණු පිළිබඳ සැලකිලිමත්වීම වැදගත් ය. ප්‍රවෘත්ති රැස්කිරීම, වාර්තා කිරීම, සැලැසුම්කරණය සහ ඉදිරිපත් කිරීම ආදී කාර්යයන්හි දී එහි ආචාරධර්මීය ස්වරූපය අතිශයින් අවධානයට යොමුවිය යුතු ය. විශේෂයෙන් ම වාර්තාකරණයේ දී සලකා බැලිය යුතු ය. අසත්‍යය, අතිශයෝක්තිය, අපහාසය, අශ්ලීලත්වය,  අශෝභන බව, අපකීර්තිය, අසද්භාවය නම් වූ විකෘතිතාවලින් තොර ප්‍රවෘත්තිය, නිබඳ ආචාර ධර්මානුකූල වෙයි. එය අත්‍යන්තයෙන් ම සමාජ හිතකාමී ය, සදාචාරසම්පන්නය, විනයානුකූල ය.

සියල්ල විකෘති කෙරෙනුයේ සත්‍යයෙන් තොර වූ කල ය. මන්දයත්, අසත්‍ය ප්‍රකාශය හේතුකොට ගෙන, අනතුරු ව විවර කෙරෙන සෙසු සාවද්‍යතා ආවරණය සඳහා තවදුරටත් අතිශයෝක්තිය ඇතුළු තවත් බොහෝ වාගාලාප මුසු කළ යුතු බැවිනි. එය ආචාරධර්ම උල්ලංඝනයක් බව අමුතුවෙන් කිව යුතු නො වේ. එබඳු නාළිකා ක්‍රම ක්‍රමයෙන් ජන අවධානයෙන් ගිලිහී යන්නට පටන් ගනියි. මෙය රාජ්‍ය හා පෞද්ගලික රූපවාහිනී නාළිකා සියල්ල ම මෙන් ම පොදුවේ ගත්කල සියලු ජනමාධ්‍යයන්ට එක සේ වලංගු වන්නකි. අමෙරිකාවේ සුප්‍රකට කොළොම්බියානු බ්‍රෝඩ්කාස්ටින් සිස්ටම් හි (Colombia Broadcasting System) කෘතහස්ත ප්‍රවෘත්ති කලාවේදියකු වූ එඩ්වර්ඩ් ආර්. මරේගේ වදනක් මේ සඳහා වඩාත් යෝග්‍ය වෙයි.

"ආචාරධර්මයන්ට පටහැනි ව යහපත් ප්‍රවෘත්ති නිර්මාණය කළ නො හැකි ය"

ඒ අනුව, රූපවාහිනිය බඳු අතිශය ප්‍රබල මාධ්‍යයක් සත්‍යය වෙනුවෙන් පෙනී සිටින ජනතා නියෝජිතයකු වීම අතිශය වැදගත් ය. රූපවාහිනී ප්‍රවෘත්ති සන්නිවේදනයෙහි ලා රක්ෂණය විය යුතු මාධ්‍යවිද්‍යානුකූල ආචාරධර්මීය ප්‍රතිපදාව එය බව අවධාරණය කරමු.

## ආශ්‍රිත ග්‍රන්ථ

දිසානායක, විමල් (1974) ජනසන්නිවේදනය හා සමාජය, කිරුළපන, නිපුන ප්‍රකාශකයෝ, 22 පිටුව.

රත්නපාල, නන්දසේන (2007) රූපවාහිනිය හා සමාජය (ලිපිය) රූපවාහිනී සමීක්ෂා, කොළඹ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව 56-57 පිටු

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත (1982) කොළඹ, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

Eastman, Susan, W. Head and Levis Klein (1981) Television Images and Mass Conssiousness (2nd ed.) Wordsworth, Belmont

Emery, Edwin, Agee K. Warran and Ault H.H. Pillip (1969) Maincurrents of Mass Communication, N.Y. Harper and Row Publication

Levin, Sofia (2010) Television and the Society: Overview On feedback and influances, NY, Harper and Row Publication.

Maray, Edward R. (2010) News and Ethics: A handbook for News reporting in visual media, NY, Colombia Broadcasting System. p. xxi

Radhacrishnan, Sir S. (1929) Indian Philosophy. Vol 01, London, George Allen and Unwin Ltd. p. 3-4

Slant, Richerd (1986) How Television makes up your mind: Essays on Television as social and Cultural Force, NY, p. 21

Spencer, Herbert (1930) The data of Ethics, London, William and Co. Ltd., p. 132